# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2022.05.17 |

## ශ්‍රී ලංකා ගැණුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2022 අප්‍රේල්


### අප්‍රේල් මාසයේ දී නිෂ්පාදන සහ සේවා ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශක පහළ යන ලදී.

**සෑම වසරකම අප්‍රේල් මාසයේ පවතින සාමාන්‍ය පහත වැටීම මෙන්ම වෙනත් බාධාවන් හේතුවෙන් ඇතිවූ පසුබෑමද පෙන්නුම් කරමින්, නිෂ්පාදන අංශයේ ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය 2022 අප්‍රේල් මාසයේ දී පෙර මාසයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස පහත වැටුණි.** ඒ අනුව නිෂ්පාදන අංශයේ ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය 2022 අප්‍රේල් මාසයේ දී 36.4ක අගයක් වාර්තා කරමින් පෙර මාසයට සාපේක්ෂව දර්ශකාංක 21.4කින් පහළ යන ලදී. මේ සඳහා, සෑම වසරකම මෙන් මෙම වසරේදී මාර්තු මාසයේ දී ඉහළ දර්ශකාංක වාර්තා කරන නිෂ්පාදන, නව ඇණවුම්, තොග මිලදී ගැනුම් සහ සේවා නියුක්තිය යන උප දර්ශක අප්‍රේල් මාසයේ සැලකිය යුතු ලෙස පහළ යාම හේතු විය.

| | |
|---|---|
| **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**<br>**36.4** | **2022 මාර්තු මාසයට සාපේක්ෂව දර්ශකාංක 21.4 ක පහළ යෑමකි** |

විශේෂයෙන්ම, ආහාර හා පාන වර්ග නිෂ්පාදන අංශයේ සහ රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන අංශයේ දක්නට ලැබුණු නිෂ්පාදන පහත වැටීම කෙරෙහි, අලුත් අවුරුදු නිවාඩුව හේතුවෙන් අප්‍රේල් මාසයේ වැඩ කරන දින ගනන අඩු වීම, පවතින විදුලි කප්පාදුව/බලශක්ති හිඟය ද ඇතුළු සැපයුම් අංශයේ සීමාකම් බලපාන ලදී. නව ඇණවුම් අඩු වීම කෙරෙහි උත්සව සමය අවසන් වීමත් සමග විශේෂයෙන් ආහාර හා පාන නිෂ්පාදන අංශයේ ඉල්ලුම අඩු වීම හේතු විය. අළුත් අවුරුදු නිවාඩුවෙන් පසු සේවකයින් සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් සේවා නියුක්තිය උප දර්ශකය ද පෙර මාසයට සාපේක්ෂව පහත වැටුණි. තවද, දේශීය වෙළඳපොළ තුළින් අවශ්‍ය ප්‍රමාණයට ද්‍රව්‍ය මිලදී ගැනීමට නොමැතිවීම සහ අමුද්‍රව්‍ය ආනයන සඳහා ණයවර ලිපි නිකුත් කිරීමේ දුෂ්කරතා හේතුවෙන් තොග මිලදී ගැනුම් පහළ යන ලදී. අවශ්‍ය අමුද්‍රව්‍ය නොමැතිවීම හේතුවෙන් සිය නිෂ්පාදන කටයුතු සීමා කිරීමට සිදු වූ බව බොහෝ ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කරන ලදී. මේ අතර, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය 2022 අප්‍රේල් මාසයේ දී වැඩි වේගයකින් ඉහළ ගිය අතර මේ සඳහා, ජාත්‍යන්තර සැපයුම් ජාලයේ ගැටලු, විදේශ විනිමය ගෙවීම් ගැටලු හේතුවෙන් වරායෙන් භාණ්ඩ නිදහස් කරගැනීමේ ප්‍රමාදයන් සහ ඩීසල් හිඟය හේතු විය.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

| විචල්‍යය | මාර්. | අප්‍රේ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **57.8** | **36.4** | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| | | **උපදර්ශක** | | |
| නව ඇණවුම් | 66.5 | 32.0 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| නිෂ්පාදන | 56.9 | 19.0 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 52.2 | 43.4 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 45.2 | 28.0 | - | ඉහළ වේගයකින් පහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 57.5 | 70.6 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

බොහෝ අංශයන්ගෙන් වාර්තා වන අවිනිශ්චිතතාවන් හමුවේ, ඉදිරි මාස තුන තුළ පිළිබඳ නිෂ්පාදකයන්ගේ අපේක්ෂාවන් 2022 අප්‍රේල් මාසයේ දී තව දුරටත් පහත වැටුණි.

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

නිෂ්පාදන අංශයෙහි ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2022 මාර්තු මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.7කින් පහළ යමින් 2022 අප්‍රේල් මාසයේ දී 52.2ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

පෙර මාසයට සාපේක්ෂව 2022 අප්‍රේල් මාසයේ දී එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඉන්දියාව සහ සිංගප්පූරුව යන රටවල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය වැඩි වේගයකින් ද යුරෝපා කලාපයේ අඩු වේගයකින් ද වර්ධනය විය. එසේ වුවද, චීනය සහ රුසියාව යන රටවල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය පෙර මාසයට සාපේක්ෂව අප්‍රේල් මාසයේ දී පහළ යන ලදී.

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2022 මැයි 15 වන දිනට*

---

[1] *එස්&පී ග්ලෝබල්* (S&P Global) *ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමඟින් යුරෝපා කලාපය ඇතුලුව රටවල් 30 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා අංශයේ පසුබෑමක් පෙන්නුම් කරමින් සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2022 අප්‍රේල් මාසයේ දී 43.8ක දර්ශක අගයක් දක්වා පහත වැටුණ අතර,** මේ සඳහා රටේ පවතින ආර්ථික, සමාජීය සහ දේශපාලන අස්ථාවරත්වය හේතු විය.

ප්‍රධාන වශයෙන්, නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවා, රක්ෂණ, දේපළ වෙළඳාම සහ ප්‍රවාහන යන උප අංශවල දක්නට ලැබුණු පහළ යෑම් සමඟ, 2021 අගෝස්තු මාසයෙන් පසු පළමු වරට 2022 අප්‍රේල් මාසයේ දී නව ව්‍යාපාර පහත වැටුණි.

ව්‍යාපාර ක්‍රියාකාරකම් ද අප්‍රේල් මාසයේ දී පහත වැටුණු අතර, මේ සඳහා අඛණ්ඩ විදුලි කප්පාදුව සහ ඉන්ධන හා ගෑස් ඇතුළු යෙදවුම් සපයා ගැනීමේ පවතින දුෂ්කරතා නිසා ව්‍යාපාර මෙහෙයුම් සඳහා ඇති වූ බාධා මුල් විය. තවද, ක්‍රය ශක්තිය අඩු වීම, සංචාරක පැමිණීම් පහත වැටීම සහ රට තුළ පවතින අවිනිශ්චිතතා හේතුවෙන් ඉල්ලුම පහළ යෑම, උප අංශ කිහිපයක ව්‍යාපාර ක්‍රියාකාරකම්වලට ද අහිතකර ලෙස බලපෑවේය. ඒ අනුව, නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවා, වෘත්තීය සේවා, අධ්‍යාපන, රක්‍ෂණ සහ දේපළ වෙළඳාම යන උප අංශවල සැලකිය යුතු පහළ යෑම් අප්‍රේල් මාසය තුළ වාර්තා විය. කෙසේ වුවද, ප්‍රධාන වශයෙන් තොග හා සිල්ලර වෙළෙඳාම සහ අනෙකුත් පෞද්ගලික සේවා යන උප අංශවල සමාගම් කිහිපයක්, උත්සව සමය හේතුවෙන් ප්‍රගතියක් ලබා ඇත.

කොන්ත්‍රාත් කාල සීමා අවසන්වීම්, විශ්‍රාම යෑම් සහ සේවයෙන් ඉවත්වීම් හේතුවෙන් 2022 අප්‍රේල් මාසයේ දී සේවා නියුක්තියේ සුළු අඩුවීමක් වාර්තා විය. මේ අතර, විදුලි කප්පාදුව, සැපයුම් හිඟය සහ ප්‍රවාහන දුෂ්කරතා හේතුවෙන් 2021 සැප්තැම්බර් මාසයෙන් පසු පළමු වරට නිමකිරීමට නියමිත කාර්යයන් ඉහළ ගියේය.

| විචල්‍යය | මාර්. | අප්‍රේ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **51.3** | **43.8** | **-** | **ඉහළ යෑමක සිට පහළ යෑමක්** |
| | | <u>උපදර්ශක</u> | | |
| නව ව්‍යාපාර | 56.8 | 41.5 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 52.1 | 40.5 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 54.2 | 49.5 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 48.9 | 52.8 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 44.8 | 34.7 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් අප්‍රේල් මාසයේ දී තවදුරටත් පහත වැටුණු අතර, අඛණ්ඩ විදුලි කප්පාදුව, ඉන්ධන, ගෑස් සහ අනෙකුත් යෙදවුම් සම්බන්ධව පවතින සැපයුම් හිඟය හා ඒවායෙහි මිල සීඝ්‍ර වශයෙන් ඉහළ යෑම, ණය ගැනීමේ පිරිවැය ඉහළ යෑම, අත්‍යවශ්‍ය නොවන දෑ සඳහා ඇති ඉල්ලුම පහළ යෑම සහ රටේ පවතින ආර්ථික, දේශපාලන හා සමාජ අස්ථාවරත්වය මේ සඳහා හේතු විය.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**43.8**

**2022 මාර්තු මාසයට සාපේක්ෂව දර්ශකාංක 7.5ක පහළ යෑමකි.**

සේවා අංශයෙහි
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

ගෝලීය සේවා ක්‍රියාකාරකම්හි වර්ධනයක් පෙන්නුම් කරමින්, ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2022 මාර්තු මාසයේ පැවති 53.4 සිට 2022 අප්‍රේල් මාසයේ දී 51.9ක් වාර්තා කළේය.

ඇමරිකා එක්සත් ජනපදය, ඉන්දියාව, එක්සත් රාජධානිය සහ ජපානය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් එම රටවල සේවා අංශ පසුගිය මාසයට සාපේක්ෂව 2022 අප්‍රේල් මාසයේ දී වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර, චීනයේ එය පහළ යෑමක් පෙන්නුම් කළේය.

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2022 මැයි 15 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

සේවා නියුක්තිය : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන

ගැනුම් තොගය : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍ය

ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය

නිමකිරීමට නියමිත කාර්යයන් : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම්

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.